1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී හි ("සමාගම") සහ එහි පරිපාලිත සමාගම්වල ("සමූහයේ") 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභාලාභ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගම සහ සමූහයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රීලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වූ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ප්‍රධාන විගණන කරුණු

ප්‍රධාන විගණන කාරණා නම්, මාගේ වෘත්තීය විනිශ්චයේදී, ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනයේදී වඩාත් වැදගත් වූ කරුණුය. මෙම කරුණු සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීමේ සන්දර්භය තුළ සහ ඒ පිළිබඳව මාගේ මතය සැකසීමේදී ආමන්ත්‍රණය කරන ලද අතර, මෙම කරුණු සම්බන්ධයෙන් මම වෙනම මතයක් නොසපයන්නෙමි. පහත එක් එක් කරුණ සඳහා, මාගේ විගණනය එම කරුණ ආමන්ත්‍රණය කළ ආකාරය පිළිබඳ විස්තරය එම සන්දර්භය තුළ සපයා ඇත.
මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වූ විගණකගේ වගකීම යන කොටසේ විස්තර කර ඇති වගකීම්, මෙම කරුණු සම්බන්ධයෙන් ද ඇතුළුව, මම ඉටු කර ඇත්තෙමි. ඒ අනුව, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන අවදානම පිළිබඳ මාගේ තක්සේරුවට ප්‍රතිචාර දැක්වීම සඳහා නිර්මාණය කර ඇති ක්‍රියා පටිපාටිවල කාර්යසාධනය මාගේ විගණනයට ඇතුළත් විය. පහත කරුණු ආමන්ත්‍රණය කිරීම සඳහා සිදු කරන ලද ක්‍රියා පටිපාටි ඇතුළුව, මාගේ විගණන ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵල, මේ සමඟ ඇති මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණන මතයට පදනම සපයනු ලබයි.

ප්‍රධාන විගණන කරුණ

(අ) ස්ථාවර දූරකථන සහ ජංගම සන්නිවේදන සේවාවන්හි ආදායම් හඳුනා ගැනීම

මූල්‍ය ප්‍රකාශනවල සටහන් 3(1) හි දක්වා ඇති සහ සටහන් 6(අ) හි හෙළිදරව් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තියට අනුකූලව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ස්ථාවර දූරකථන සහ ජංගම සන්නිවේදන සේවා සැපයීමෙන් සමූහය රු. මිලියන 111,148 ක ආදායමක් හඳුනාගෙන තිබුණි.

ස්ථාවර දූරකථන සහ ජංගම සන්නිවේදන සේවා සැපයීමෙන් ලැබෙන ආදායම හඳුනා ගැනීම මාගේ විගණනයේ ප්‍රධාන අවධානයක් යොමු කළ කරුණක් වූයේ:

- පහත සඳහන් කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ආදායම් හඳුනා ගැනීමේ සංකීර්ණතාව:
  - (i) අනුපාත ව්‍යුහයන්වල නිතර සිදුවන වෙනස්කම් සහ බහු නිෂ්පාදන ලක්ෂණ සහිත සැකසුම්
  - (ii) දෘඩාංග සහ සේවාවල විවිධ සංයෝජනවල විකුණුම් වලින් පැන නගින විශාල ගනුදෙනු පරිමාව.
  - (iii) ආදායම ග්‍රහණය කර ගැනීමට, සැකසීමට සහ වාර්තා කිරීමට භාවිතා කරන බහු තොරතුරු තාක්ෂණ පද්ධති.

- පහත සඳහන් දේ තීරණය කිරීමේදී කළමනාකරණය විසින් ක්‍රියාත්මක කරන ලද වැදගත් විනිශ්චය:
  - (i) ආදායම එක් අවස්ථාවකදී හෝ යම් කාල පරාසයක් තුළ හඳුනා ගන්නේද යන්න.
  - (ii) පාරිභෝගික ගිවිසුම්වල කාල සීමාව
  - (iii) ගනුදෙනු මිල සහ එය ඒකාබද්ධ නිෂ්පාදන සහ සේවාවන් සඳහා වෙන් කිරීම.

මාගේ විගණනය ප්‍රධාන විගණන කරුණ ආමන්ත්‍රණය කළ ආකාරය

මාගේ විගණන ක්‍රියා පටිපාටිවලට පහත ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය;

- තොරතුරු තාක්ෂණය මත පදනම් වන අදාළ ප්‍රධාන හස්ත පාලනයන් සහ ආදායම් ගනුදෙනු ග්‍රහණය කර ගැනීම සහ මැනීම සම්බන්ධයෙන් හස්ත පාලනයන් පරීක්ෂා කරන ලදී.

- ආදායම් හඳුනා ගැනීම කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති IT පද්ධතිවල IT පොදු පාලනයන් සහ අදාළ ප්‍රධාන IT යෙදුම් පාලනයන් පරීක්ෂා කරන ලදී. මාගේ අභ්‍යන්තර විශේෂිත සම්පත්වල සහාය ඇතිව ආදායම් හඳුනාගැනීමට අදාළ තෝරාගත් IT පද්ධතිවල ආරක්ෂක අධීක්ෂණ අංශ සඳහා ක්‍රියාත්මක කරන ලද පාලනයන්හි ප්‍රමාණවත් බව පරීක්ෂා කිරීම ද මාගේ ක්‍රියා පටිපාටියට ඇතුළත් විය.

- අදාළ පරිදි, ආදායම් ගනුදෙනු ග්‍රහණය කර ගැනීම සහ මැනීම සම්බන්ධයෙන් නැවත ගණනය කිරීම් සහ අවසානය දක්වා සැසඳීම් පරීක්ෂා කිරීම සිදු කරන ලදී.

- පාරිභෝගික කොන්ත්‍රාත්වල අදාළ නියමයන් සහ කොන්දේසි මත පදනම්ව, ආදායම් හඳුනා ගැනීමේ කාලය, පාරිභෝගික කොන්ත්‍රාත්වල කාලසීමාව සහ කාර්යසාධන වගකීමට ගනුදෙනු මිල වෙන් කිරීමේදී කළමනාකරණය විසින් කරන ලද සැලකිය යුතු විනිශ්චයන්හි සාධාරණත්වය තක්සේරු කරන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල සටහන 3 (1) සහ සටහන 6 (අ) හි පිළිබිඹු වන අදාළ හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව තක්සේරු කරන ලදී.

(ආ) ජාල වත්කම්වල ධාරණ වටිනාකම

2024 දෙසැම්බර් 31 වන විට, කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ඇතුළුව සමූහයේ ජාල වත්කම්වල වටිනාකම රු. මිලියන 140,841 ක් වූ අතර එය සමූහයේ මුළු වත්කම්වලින් සියයට 59 ක් නියෝජනය විය.

කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ඇතුළුව ජාල වත්කම්වල ධාරණ වටිනාකම විගණනයේදී ප්‍රධාන අවධානය යොමු කළ කරුණක් වූයේ:

- 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා රු. මිලියන 20,459 ක් වූ ජාල වත්කම්වල වාර්තා වූ ක්ෂය වීම්වල ප්‍රමාණාත්මකභාවය.

- සමූහය විසින් ජාල වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය ඇස්තමේන්තු කිරීම හා සම්බන්ධ කළමනාකරණය විසින් භාවිතා කරන විනිශ්චයන්. එයට කර්මාන්ත පරිචය පිළිබඳ සමූහයේ සාමූහික තක්සේරුව, අභ්‍යන්තර තාක්ෂණික ඇගයීම සහ ජාල වත්කම්වල ප්‍රයෝජනවත් ආර්ථික ජීව කාලය නිගමනය කිරීමේදී සමාන වත්කම් පිළිබඳ අත්දැකීම් ඇතුළත් වේ.

- තෝරාගත් ජාල වත්කම්වල භාවිත වටිනාකම (value in use) ගණනය කිරීම් සඳහා භාවිතා කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් හා සම්බන්ධ කළමනාකරණ උපකල්පන, විනිශ්චයන් සහ ඇස්තමේන්තුවල ප්‍රමාණය.

- ජාල වත්කම්වලට අදාළව කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ වටිනාකමෙ හානිකරණය තක්සේරු කිරීමේදී කළමනාකරණය විසින් භාවිතා කරන ලද විනිශ්චයන්හි ප්‍රමාණය සහ උපකල්පන.

- වැදගත් විනිශ්චයන් සැලකිල්ලට ගනිමින් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ සිට ජාල වත්කම් දක්වා ක්‍රියාත්මක කරන ලද වත්කම් (commissioned assets) හඳුනා ගැනීමේ කාලය සහ ජාල වත්කම් ක්ෂය වීම ආරම්භ කළ දිනයේ යෝග්‍යතාවය

විගණන ක්‍රියා පටිපාටිවලට පහත සඳහන් ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය.

- ජාල වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය ඇස්තමේන්තු කිරීමේදී සමූහයේ ක්‍රියාවලිය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- ජාල වත්කම්වල ප්‍රයෝජනවත් ආයු කාලය ඇස්තමේන්තු කිරීම සඳහා කළමනාකරණය විසින් භාවිතා කරන විනිශ්චයන්හි සාධාරණත්වය අභ්‍යන්තර තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසිද්ධියේ ලබා ගත හැකි තොරතුරුවලට තක්සේරු කරන ලදී.

- තෝරාගත් ජාල වත්කම්වල වට්ටම් සහිත මුදල් ප්‍රවාහයන් කළමනාකරණය විසින් පුරෝකථනය කර ඇති ආකාරය පිළිබඳ අවබෝධයක් ලබා ගත් අතර කළමනාකරණය විසින් භාවිතා කරන ලද දත්තවල සම්පූර්ණත්වය සහ නිරවද්‍යතාවය පරීක්ෂා කරන ලදී.

- කළමනාකාරිත්වය විසින් කරන ලද විනිශ්චයන් ඇතුළුව ජාල වත්කම් පිළිබඳ කළමනාකාරිත්වයේ හානිකරණ තක්සේරුව ඇගයීමට ලක් කරන ලදී:

  (i) නිශ්චිත වත්කම් කෙරෙහි බලපාන ආකාරය ඇතුළුව ව්‍යාපාර උපාය මාර්ගය සහ ව්‍යාපාර පරිසරයේ සිදුවන වෙනස්කම්වල ස්වභාවය සහ බලපෑම; සහ

  (ii) හඳුනාගත් ජාල වත්කම්වල ධාරණ වටිනාකම කෙරෙහි මෙම වෙනස්කම්වල බලපෑමේ ප්‍රමාණය.

- ව්‍යාපාරයේ සහ කර්මාන්තයේ දැනුම මත පදනම්ව, දිගු කාලයක් තුළ ක්‍රියාත්මක කර නොමැති ව්‍යාපෘති සම්බන්ධ ජාල වත්කම් සඳහා කළමනාකරණය විසින් හඳුනා ගන්නා ලද සම්භාව්‍ය හානිකරණ දර්ශක

ඇතුළුව, ජාල වත්කම්වල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ සම්බන්ධයෙන් භාවිතා කරන ලද කළමනාකරණ විනිශ්චයන්හි සහ උපකල්පනවල සාධාරණත්වය තක්සේරු කරන ලදී.

- අයවැයගත ව්‍යාපෘති කාලසීමාවට අදාළව එම ව්‍යාපෘති නිම කිරීමේ වත්මන් තත්ත්වය ඇගයීමට ලක් කරන ලද අතර, භාවිතය සඳහා ආරම්භ කරන ලද ජාල වත්කම්වල වටිනාකම්, අදාළ ව්‍යාපෘති කළමනාකරුවන් සමඟ සාකච්ඡා කිරීමෙන් සහ අදාළ ලියකියවිලි පරීක්ෂා කිරීමෙන්, කාලීනව, කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩවලින් නිසි ලෙස මාරු කර, අදාළ දේපල, පිරියත සහ උපකරණ පන්තිය යටතේ හඳුනාගෙන තිබේද යන්න තක්සේරු කරන ලදී.

- වර්ෂය තුළ ජාල වත්කම් සඳහා පිරිවැය ප්‍රාග්ධනීකරණය කිරීමේ යෝග්‍යතාවය තීරණය කරන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3 (ඈ) සහ සටහන 14 හි පිළිබිඹු වන අදාළ හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත් බව තක්සේරු කරන ලදී.

(ඇ) පොලී සහිත ණය සහ ණය ගැනීම්

වාර්තාකරන දිනය වන විට, සමූහයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3 (ඇ) (ii), 4.2,8 සහ 24 හි හෙළිදරව් කර ඇති පරිදි සමූහය විසින් මුළු පොලී දරන ණය සහ ණය ගැනීම් රු. මිලියන 71,725 ක් වාර්තා කර ඇති අතර, ඉන් රු. මිලියන 14,365 ක් ජංගම වගකීම් ලෙසත් ඉතිරි රු. මිලියන 57,360 ක් ජංගම නොවන වගකීම් ලෙසත් වාර්තා කර තිබුණි. පොලී දරන ණය සහ ණය ගැනීම් ප්‍රධාන විගණන කාරණයක් වූයේ:

- වාර්තාකරණ දිනට සමූහයේ මුළු වගකීම්වලින් සියයට 49 ක් නියෝජනය කළ පොලී දරන ණය සහ ණය ගැනීම් ශේෂයේ ප්‍රමාණාත්මකභාවය.

විගණන ක්‍රියා පටිපාටිවලට පහත සඳහන් ප්‍රධාන ක්‍රියා පටිපාටි ඇතුළත් විය.

- ණය ගිවිසුම්, පහසුකම් ලිපි සහ අනෙකුත් ගිවිසුම් ලේඛන පරීක්ෂා කිරීමෙන්, පවතින පොලී සහිත ණය සහ ණය ගැනීම් සඳහා අදාළ නියමයන් සහ කොන්දේසි පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදී.

- වාර්තාකරන දිනට හිඟ මුදල් සඳහා තහවුරු කිරීම් ලබා ගන්නා ලදී.

- අනාගත මුදල් ප්‍රවාහයන් පිළිබඳ කළමනාකාරිත්වයේ තක්සේරුව සහ පවතින ගිවිසුම්ගත විධිවිධානවලට අනුව ණය සේවා බැඳීම් සපුරාලීම සඳහා එහි සැලසුම් ලබා ගත් අතර කළමනාකාරිත්වය විසින් කරන ලද වැදගත් විනිශ්චයන් සහ උපකල්පනවල සාධාරණත්වය ඇගයීමට ලක් කරන ලදී.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සටහන් 3 (ඇ) (ii), 4.2,8 සහ 24 හි පිළිබිඹු වන අදාළ හෙළිදරව් කිරීම්වල ප්‍රමාණවත්භාවය ද තක්සේරු කරන ලදී.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ දී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර, අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමූහයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි සමාගමේ සහ සමූහයේ ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා වූ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ සහ සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණ සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

- ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා ආයතනවල මූල්‍ය තොරතුරු හෝ සමූහය තුළ ව්‍යාපාර ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගන්නා ලදී. සමූහ විගණනයේ මෙහෙයවීම, අධීක්ෂණය හා කාර්යසාධනය සඳහා මා වගකිව යුතු වේ. මාගේ විගණන මතය සඳහා සම්පූර්ණයෙන් මා වගකිව යුතුය.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ සහ සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ සහ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම සහ සමූහය ක්‍රියා කර ඇති බව,

- සමාගම සහ සමූහය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සමාගමේ සහ සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

2.1.1 සමාගම

සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවලින් පසුගිය මූල්‍ය වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 1,132 ක අලාභයට සාපේක්ෂව රු. මිලියන 2,113 ක ලාභයක් පෙන්නුම් කරන ලදී. මෙමගින් සමාගමේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 3,245 ක හෙවත් සියයට 287 ක වැඩි වීමක් නියෝජනය වේ. ස්ථාවර බ්‍රෝඩ්බෑන්ඩ් (Fixed Broadband) සහ ව්‍යවසාය විසඳුම් (enterprise solutions) සඳහා ඇති ඉල්ලුම අඛණ්ඩව පැවතීම හේතුවෙන් ආදායම රු. මිලියන 1,598 කින් හෙවත් සියයට 2.3 කින් වැඩිවීම මෙම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු විය.

2.1.2 සමූහය

සමාලෝචිත වර්ෂය සඳහා සමූහයේ මූල්‍ය ප්‍රතිඵලය, පසුගිය මූල්‍ය වර්ෂයේ වාර්තා වූ රු. මිලියන 3,921 ක අලාභයට සාපේක්ෂව රු. මිලියන 3,120 ක ලාභයක් පෙන්නුම් කරන ලදී. මෙමගින් සමාලෝචිත වර්ෂය තුළ සමූහයේ මූල්‍ය කාර්යසාධනයේ රු. මිලියන 7,041 ක හෙවත් සියයට 1,796 ක වැඩි වීමක් නියෝජනය වේ. ලාභදායිතාවයේ වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ස්ථාවර සහ ජංගම මෙහෙයුම් දෙකෙහිම වැඩිදියුණු කළ කාර්යසාධනය හේතුවෙන් ආදායම රු. මිලියන 4,730 කින් හෙවත් සියයට 4.4 කින් වැඩි වීමයි. සමාගමේ ජංගම දුරකථන සම්බන්ධ පරිපාලිත සමාගම වන මොබිටෙල්, එහි පෙර වර්ෂවල අලාභ ප්‍රතිවර්තනය කර 2024 දී සමූහයේ ලාභදායිත්වයට දායකයෙකු ලෙස ඉස්මතු විය.

2.2 ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ ආදායම, සෘජු පිරිවැය, විකුණුම් සහ අලෙවිකරණ පිරිවැය, පරිපාලන පිරිවැය සහ පොලී ආදායම පිළිබඳ ප්‍රවණතා විශ්ලේෂණය පහත පරිදි වේ.

	සමූහය			සමාගම		
	2024 රු. මිලියන	**2023** රු. මිලියන	විචලනය **%**	**2024** රු. මිලියන	**2023** රු. මිලියන	විචලනය **%**
ආදායම	111,148	106,418	4.44	71,309	69,711	2.29
සෘජු පිරිවැය	65,009	67,840	4.17	39,941	41,256	3.19
විකුණුම් සහ අලෙවිකරණ පිරිවැය	10,940	11,100	1.44	6,370	5,589	(13.97)
පරිපාලන පිරිවැය	24,010	23,376	(2.71)	17,709	17,785	0.43
පොලී ආදායම	1,087	1,685	(35.49)	812	1,280	(36.56)

(i) සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ විකුණුම් සහ අලෙවිකරණ වියදම්, පෙර වර්ෂයේ රු. මිලියන 5,589 ට සාපේක්ෂව රු. මිලියන 6,370 ක් විය. මෙය සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 781 ක හෙවත් ආසන්න වශයෙන් සියයට 13.97 ක වැඩි වීමක් නියෝජනය කරයි.

(ii) සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ පොලී ආදායම, පෙර වර්ෂයේ රු. මිලියන 1,280 ට සාපේක්ෂව රු. මිලියන 812 ක් විය. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව රු. මිලියන 468 ක හෙවත් ආසන්න වශයෙන් සියයට 36.56 ක අඩු වීමක් පිළිබිඹු කරයි.

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂය සඳහා සමාගමේ සහ සමූහයේ ප්‍රධාන අනුපාත පහත පරිදි වේ.

	සමූහය		සමාගම	
	2024	**2023**	**2024**	**2023**
ජංගම අනුපාතය (වාර ගණන)	0.82	0.62	0.82	0.56
ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන)	0.76	0.57	0.76	0.50
දළ ලාභ අනුපාතය (%)	41.51	36.25	43.99	40.82
ශුද්ධ ලාභ අනුපාතය (%)	2.8	(3.68)	2.9	(1.62)
හිමිකම් මත ප්‍රතිලාභය (%)	3.41	(4.45)	3.1	(1.7)
කොටසක ඉපැයුම (Rs.)	1.73	(2.17)	1.17	(0.63)
වත්කම් මත ප්‍රතිලාභය (%)	1.28	(1.59)	1.14	(0.60)

(අ) 2024 වර්ෂය තුළ සමූහයේ ද්‍රවශීලතා තත්ත්වය වැඩි දියුණු වීමක් පෙන්නුම් කරන ලදී. 2023 දී 0.62 සිට 0.82 දක්වා ජංගම අනුපාතය වැඩි වීම සහ 0.57 සිට 0.76 දක්වා ක්ෂණික වත්කම් අනුපාතය වැඩි වීම මගින් මෙය සනාථ වේ. මෙම අනුපාතවල වැඩි වීම, පෙර වර්ෂයට සාපේක්ෂව කෙටිකාලීන වගකීම් සපුරාලීමට සමූහයට ඇති හැකියාව පෙන්නුම් කෙරේ.

(ආ) 2024 වර්ෂය තුළ සමූහයේ දළ ලාභයේ වැඩි වීමක් දක්නට ලැබුණි. 2023 වර්ෂයේදී සියයට 36.25 ක් වූ දළ ලාභ අනුපාතය සමාලෝචිත වර්ෂය තුළ සියයට 41.51 දක්වා වැඩි වී ඇති අතර, එය ඵලදායී පිරිවැය කළමනාකරණය සහ වැඩිදියුණු කළ මෙහෙයුම් කාර්යක්ෂමතාව පිළිබිඹු කරයි. තවද, ශුද්ධ ලාභ අනුපාතය ද ධනාත්මක බවට පත් වී ඇති අතර, 2023 වසරේ සියයට 3.68 ක අලාභයක සිට 2024 වසරේ සියයට 2.8 ක ලාභයක් දක්වා වැඩි වී ඇති අතර, එය පෙර වර්ෂයේ අලාභයෙන් යථා තත්ත්වයට පත්වීමේ දියුණුවක් පෙන්නුම් කෙරේ.

(ඇ) සමූහයේ වත්කම් මත ප්‍රතිලාභය (ROA) 2023 දී සෘණ සියයට 1.59 සිට 2024 දී සියයට 1.28 දක්වා වර්ධනය වී තිබුණි. මෙයින් 2024 දී සමූහය සිය ආදායම් උත්පාදනය කිරීම සඳහා මූළ වත්කම් වඩාත් කාර්යක්ෂමව භාවිතා කර ඇති බව පෙන්නුම් කෙරේ.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සමාගම සංස්ථාපනය කිරීම

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ සංස්ථාගත කිරීමේ නියෝගයක් මගින් සමාගම ස්ථාපිත කරන ලද අතර 1990 පෙබරවාරි 6 වන දිනැති අංක 596/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී. පසුව, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 23 වන වගන්තිය යටතේ 1991 ජූලි 24 වන දින තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යවරයාගේ ("ඇමතිවරයා") නියෝගයෙන් සහ 1991 අගෝස්තු 9 වන දිනැති අංක 675 දරන ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද, 1991 සැප්තැම්බර් 1 වන දින පැවරීමේ දිනයට පෙර විදුලි සංදේශ දෙපාර්තමේන්තුවට හිමි වූ හෝ යටත් වූ සියලුම දේපළ, අයිතිවාසිකම් සහ වගකීම් (ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 23 වන වගන්තියේ 2 වන උප වගන්තියට අනුව අමාත්‍යවරයා සහ සමාගම අතර ඇති කරගත් ගිවිසුමෙන් බැහැර කර ඇති ඒවා හැර) සමාගමට පවරා දෙන ලදී.

1987 අංක 23 දරන රාජ්‍ය සංස්ථා හා රජයට අයත් ව්‍යාපාර ඒකක රාජ්‍ය සමාගම් බවට පත් කිරීමේ පනත යටතේ, 1996 සැප්තැම්බර් 25 වන දිනැති අංක 942/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින්, සමාගම 1996 සැප්තැම්බර් 25 වන දින සීමිත පොදු සමාගමක් බවට පරිවර්තනය කරන ලද අතර 2003 ජනවාරි මාසයේදී කොළඹ කොටස් වෙළඳපොලේ කොටස් ලැයිස්තුගත කරන ලදී. 2007 ජුනි 4 වන දින ශ්‍රී ලංකා ටෙලිකොම් පීඑල්සී ලෙස 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගම නැවත ලියාපදිංචි කරන ලදී.

3.2 සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකාව පුරා පුළුල් විදුලි සංදේශ සේවා කළඹක් සමූහය විසින් පිරිනමනු ලබන අතර, එහි ප්‍රධාන මෙහෙයුම් දේශීය හා ජාත්‍යන්තර ස්ථාවර සහ ජංගම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) මෙහෙයුම් තුළ පවතී. ඊට අමතරව සමූහය විසින් අනිකුත් දේ අතර, ස්ථාවර සහ රැහැන් රහිත බ්‍රෝඩ්බෑන්ඩ් සේවා, Internet Protocol Television (IPTV), දත්ත මධ්‍යස්ථාන සහ වලාකුළු සේවා (cloud services), ඩිජිටල් නිෂ්පාදන, ජාත්‍යන්තර සෘජු ඇමතුම් (IDD) සේවා, ජංගම මුදල්, සමුද්‍රීය සම්ප්‍රේෂණය සහ අගය එකතු කළ සේවාවන් සපයනු ලැබේ.

2024 මූල්‍ය වර්ෂය තුළ පරිපාලිත සමාගම් සහ ඒවායේ ව්‍යාපාරික ක්‍රියාකාරකම් කෙරෙහි සමාගමේ ඇල්ම පහත පරිදි වේ:

පරිපාලිතයේ නම	**ව්‍යාපාර ක්‍රියාකාරකම්**
• සීමාසහිත මොබිටෙල් පුද්ගලික සමාගම	ජංගම දුරකථන සන්නිවේදන සේවා
• eChannelling පී.එල්.සී	සෞඛ්‍ය සේවා සහ අනෙකුත් කර්මාන්ත සඳහා ඩිජිටල් ජීවන රටා විසඳුම්.
• සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් (සේවා) සමාගම	සම්පූර්ණ ජාල විසඳුම්, IPTV සහාය සේවා, නාමාවලි තොරතුරු සහ ඩිජිටල් සේවා (SLT Vision Com (Private) Limited සහ SLT Digital Services (Private) Limited යන සමාගම්, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගමෙහි පූර්ණ පරිපාලිත ආයතන වන අතර, සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් (සේවා) සමාගම සමඟ ඒකාබද්ධ කර තිබුණි.)
• සීමාසහිත Xyntac Singapore පුද්ගලික සමාගම	සිංගප්පූරුවේ රැහැන්ගත විදුලි සංදේශ ජාල මෙහෙයුම්